සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date: 2023.03.02 |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම - 2022 වැඩසටහන යටතේ දත්ත රැස් කරන සමීක්ෂණ කටයුතු සිදු කරන නිළධාරීන්ට ගෙවීම් සිදු කිරීම</u>

ඉහත වැඩසටහනෙහි ක්ෂේත්‍ර දත්ත එක් රැස් කිරීමේ අදියර නොයෙකුත් අභියෝග හමුවේ ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට ඔබ දක්වන උනන්දුව සම්බන්ධයෙන් මාගේ කෘතඥතාවය පළ කරමි.

02. සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(3) වගන්තිය අනුව අයදුම්පත් ඉදිරිපත් කර ඇති තැනැත්තන් විසින් කළ යුතු ප්‍රකාශනයට අදාළ දත්ත රැස් කිරීමට සංගණන නිලධාරියෙකුට එක් නිවසකට ගොස් දත්ත රැස් කිරීම සඳහා රු.300.00 ක් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබේ. මේ සඳහා මුදල් ලබා ගැනීම සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය යටතේ රු.150.00 ක්ද සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ ප්‍රතිපාදන යටතේ රු.150.00 ක්ද වශයෙන් සිදු කෙරේ. එහෙයින් මේ ගෙවීම කිරීමට අදාළව ගිණුම් තැබීම වෙන වෙනම කළ යුතුව තිබේ.

03. අස්වැසුම ජංගම යෙදවුම මගින් දත්ත පද්ධතියේ ඇතුළත් කර ඇති දත්ත ප්‍රමාණය මත ගෙවීම් කටයුතු කරනු ලබන අතර ඒ සඳහා වන ගෙවීම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල බැංකු ගිණුමට සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය මගින් හා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මගින් බැර කරනු ලැබේ.

04. ඒ අනුව ඔබ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබෙන සියළුම ලැබීම් සඳහා අදාළ තහවුරුවන් ලිඛිතව ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී.විජයරත්න
සභාපති / කොමසාරිස් O/C

පිටපත් -
01. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු. දැ.ගැ.ස.
02. සියළුම දිසාපතිවරුන් වෙත - කරු. දැ.ගැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ - කරු. දැ.ගැ.ස.
04. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය - කරු. අ.ක.ස.
05. ගණකාධිකාරි, සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය - කරු. අ.ක.ස.
06. ගණකාධිකාරි, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය - කරු. අ.ක.ස.

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk